www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Provincial Education - NWP**

| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 21 S |
|---|---|---|

නම ............................................... **සිංහල භාෂාව හා සාහිත්‍යය I -කොටස** **කාලය පැය 02 යි**

**උපදෙස් :**
**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1 - කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

- **අංක 01, හා 02 ප්‍රශ්න වල ඉරි ඇඳි කොටස වෙනුවට යෙදිය හැකි වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) පන්තියට අලුතෙන් පැමිණි ඔහු මගේ <u>හොඳම මිතුරෙකි</u>

(I) අසල්වැසියෙ කි  (II) අඹ යාළුවෙ කි .
(III) ගම්පලයි රයිගමයි වගේ  (IV) ජාඩියට මූඩිය වගේ.

(2) නායකයෙකු හැම විටම <u>වැනෙන තීරණ</u> නොගත යුතුය.

(I) දෙබිඩි පිළිවෙතක්  (II) උඩින් පල්ලෙන් සොයා බලා
(III) නොසැලකිල්ලෙන්  (IV) මඩේ සිට වූ ඉන්න වගේ

- **අංක 03 - 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(3) වර්තමාන ලේඛන ව්‍යවහාරයේ දක්නට නොලැබෙන සඤ්ඤක අකුර කුමක්ද ?

(I) ග  (II) ඦ  (III) ඹ  (IV) ඬ

(4) අපේ පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය වන්නේ,

(I) සද්ධර්මරත්නාවලිය  (II) ලෝකෝපකාරය  (III) සිදත් සඟරාව  (IV) ලේඛන රීතිය

(5) අල්ප ප්‍රාණ අක්ෂර පමණක් අඩංගු පිළිතුර තෝරන්න .

(I) ච, බ, ජ  (II) ක, ඨ, ප  (III) ද, ය, බ  (IV) හ, ස, ඨ

- **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) (I) පරිනාමය  (II) සණ්ටාරය  (III) පළතුරු  (IV) සියළු

(7) (I) වෙළඳපොළ  (II) කණ්නාඩි  (III) මර්ධනය  (IV) ප්‍රශ්ණ

- **හිස්තැනට සුදුසු වචනය තෝරා වාක්‍යය සම්පූර්ණ කරන්න.**

(8) සඳකඩ ............................... (පහන/පහණ) සිංහලයාගේ විශිෂ්ට කලා නිර්මාණයකි.

(9) වහා ගිනිගන්නා .............................(සුළුය/සුලුය)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(10) පාසල් වත්තේ අලුතින් (නල/නළ) ......................... ළිඳක් සෑදුවේ ය.

● දී ඇති අනුක්ත පදවල උක්ත පදය ලියන්න.

(11) ඔවුන් -

(12) ගුරුවරුන් -

(13) දී ඇති සාමාන්‍ය ව්‍යවහාරයේ ඇති පද වලට කමත් භාෂාවේ යොදන පද ලියන්න

(I) කළය - (II) කමතේ ආහාරය -

● අංක 14 සිට 15 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(14) නුඹ විභාගයට හොඳින් සූදානම් ......................... (වූවෙහු ද/විය/වූවෙහි ද )

(15) වෘක්ෂ ලතා වර්ෂාවෙන් නව පණ ......................... (ගත්හ/ගන්නේය/ගනිති)

● විරුද්ධාර්ථ පද ලියා දක්වන්න.

(16) (I) යහ ගුණ - (II) ඈත -

● මුලින් දී ඇති පදයට සමාන නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(17) සාගරය - ( සයුර, මුහුද, සිසි, සිඳු )

(18) සඳ - ( චන්ද්‍රයා , තරුපති, දිනකර, සොමි)

● 19 හා 20 ප්‍රශ්න වල ඉරි ඇඳි පද කවර ක්‍රියා පද වර්ගයට අයත් ද යන්න තෝරා යටින් ඉරක් අඳින්න

(19) තාත්තා රූපවාහිනිය බලමින් බත් කෑවේය.

(I) පූර්ව ක්‍රියා (II) අවසාන ක්‍රියා

(III) මිශ්‍ර ක්‍රියා (IV) ආශිර්වාද ක්‍රියා

(20) ළමයි වතුරට පැන සෙල්ලම් කළහ.

(I) මිශ්‍ර ක්‍රියා (II) පූර්ව ක්‍රියා

(III) විධි ක්‍රියා (IV) අවසාන ක්‍රියා

(ලකුණු 2 x 20 - 40)

## II කොටස

● 01, 02 හා 03 ප්‍රශ්න ඇතුළත්ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01 පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරක් සපයන්න

(1) වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් ලියන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක නම් ලියන්න

(2) කමතේ දී "පැගිරි බෝය පිරීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(3) මධ්‍යම පුරුෂ බහු වචන නාම පද 02 ක් ලියා දක්වන්න

(4) ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව සමාන කම් දක්වන ඉන්දියානු ගෝත්‍රය කුමක් ද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

(5) කවියේ ඉතිරි පද ලියා දක්වන්න.

මේ කොතනින් ගෙනා ගොනා
දෙව්න්දරින් ගෙනා ගොනා
........................................................
........................................................

( ලකුණු 2 X 5 - 10 )

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ට නො අඩු රචනයක් ලියන්න.

(I) ගස්වැල් සුරකිමු
(II) පොදු දේපල රැක ගනිමු.
(III) ක්‍රීඩාව තුළින් නීරෝගී ජීවිතයක් උදාකර ගනිමු.
(IV) සඳ එළියෙන් නැහැවුණ රැයක්.

(ලකුණු 20 )

(3) ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න.

ගමේ සෑම නැන තම දමා යන කැලි කසල නිසා පරිසරය අපවිත්‍ර වීම හා ඩෙංගු රෝගය පැතිරීමේ අවදානමක් ඇත. මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂණ මහතා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපිය සකසන්න.

(ලකුණු 15 )

(4) පහත දැක්වෙන වාක්‍යය නිවැරදි කිරීමට අවශ්‍ය පදය වරහන් තුළින් තෝරා හිස්තැනින් ලියන්න.

(1) ගුරුතුමිය පාඩම රසවත්ව කියා.................................... (දුන්නේය / දුන්නාය )

(2) ඇළ , දොළ, ගංගා මුහුද කරා ගලා ............................... (බසියි , බසිති )

(3) ( නුඹලා / නුඹ ) ..................................... විභාගයට සුදානම් වූවෙහි ද?

(4) දඩයක්කරුවෙක් අහිංසක (මුවෙක් / මුවෙකු ) ................................ මරා දැම්මේය
.
(5) ( ඔවුහු / ඔවුන් ) ......................................... ශ්‍රමදානයෙන් පාර සෑදූවෝ ය.

(05) පහත උද්ධෘත ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

(I) "ස්වාමිනී , ආපසු ගොස් මේ ගැන තව ටිකක් සොයා බැලීම හොඳ නොවේ දෑ"

(II) "අයියේ , මොනවද කිරි කබළ කියන්නේ"

(III) "ඔව්, ගිහින් වරෙන්, නැත්තං කුමාරිහාමිලා තරහා වෙයs" .

(IV) "මොන දිවිල්ලක් ද? කෑ නො ගහා ඉන්නවා . මා කියන දේ ඇහෙන්නේ නෑ" .

(V) "නෑ නෑ ඒවා අයිති දුම්රිය ස්ථානයට".

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

| | පාඩමේ නම | කීවේ කවුද ? | කාහට කීවේද ? | කුමන අවස්ථාවකදී ද? |
|---|---|---|---|---|
| (I) | | | | |
| (II) | | | | |
| (III) | | | | |
| (IV) | | | | |
| (V) | | | | |

(ලකුණු 2 **x** 5 - 10 )

● දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න .

අභිතුර්ධිත ජනයෝ ස්වභාව ධර්මය දේවත්වයෙන් සලකා වැඳුම්, පිදුම් කරති, එහෙත් ඇතැම් අභිතුර්ධිතයන් පවසන්නේ තමන් බෞද්ධයන් බවයි. එහෙත් ඔවුන් බෞද්ධ වත් පිළිවෙත් අනුගමනය කරන බවත් නොපෙනේ. පන්සල, පල්ලිය, කෝවිල, වෙනසක් නොමැතිව සෑම සිද්ධස්ථානයට ම වැඳුම්, පිදුම් සඳහා යන බව පෙනෙ. අභිතුර්ධිත ජනයෝ හින්දු මෙන් සිකුරාදා දිනය ශුද්ධ දිනයක් ලෙස සලකයි, එසේම විශ්ණු, කතරගම වැනි දෙවි වරුන් අදහති.

(1) අභිතුර්ධිත ජනයා පවසන පරිදි ඔවුන්ගේ ආගම කුමක් ද?

(2) ඔවුන් වැඳුම්, පිදුම් සඳහා යන සිද්ධස්ථාන මොනවා ද?

(3) අභිතුර්ධිතයන් අදහන දෙවිවරුන් දෙදෙනාගේ නම් ලියන්න.

(4) ඔවුන්ගේ ශුද්ධ දිනය කවදා ද?

(5) දේවත්වයෙන් වැඳුම් , පිදුම් කරන්නේ කුමකට ද ?

( ලකුණු 2 **x** 5 - 10 )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk